සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level), Grade 13, Final Term Test - 2025

කෘෂි විද්‍යාව I **Agricultural Science I**	**08**	**S**	**1**	**පැය දෙකයි**

නම:.....

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

1. 1960 දශකය අගභාගයේ සිදු වූ හරිත විප්ලවය කෘෂි ක්ෂේත්‍රයේ වෙනස්කම් රාශියකට හේතු වුණි. එහි යහපත් ප්‍රතිඵල දැක්වෙන ප්‍රකාශ වනුයේ ,
   A - උසස් අස්වනු දෙන බෝග ප්‍රභේද බිහිවීම.
   B - භූමි හායනය වේගවත් වීම.
   C - ස්වභාවික ප්‍රතිරෝධීතාව පිරිහීම.
   D - අඩු ශ්‍රමයකින් වැඩ කිරීම.
   1. A පමණි.
   2. B හා C පමණි.
   3. A හා D පමණි.
   4. B හා D පමණි.
   5. A, B හා C පමණි.

2. පහත බෝගයන්ට අදාල වන පර්යේෂණ ආයතන පිහිටි ස්ථානයන්හි නිවැරදි අනුපිළිවෙල වනුයේ,

	බෝගය		**පිහිටා ඇති ස්ථානය**
A	මිරිස්	a.	කඹුරුපිටිය
B	කුරුඳු	b.	මාතලේ
C	උක්	c.	අඟුණකොළපැලැස්ස
D	එනසාල්	d.	හොරණ
E	අන්නාසි	e.	උඩවලව

   1. a,c,b,d,e
   2. e,c,a,d,b
   3. c,a,e,b,d
   4. b,c,d,e,a
   5. d,b,a,e,c


3. පහත සඳහන් දේශගුණික පරාමිතීන් මැනීමට යොදාගන්නා උපකරණ හා ඒකක නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,
   1. ආලෝක කාලසීමාව - සූර්ය විකිරණ මානය - වර්ග මීටරයට වොට් (wm^2)
   2. වාෂ්පීකරණය - වාෂ්පීකරණ තැටිය - සෙන්ටිමීටර (cm)
   3. සුළඟේ දිශාව - සුළං දිශා දර්ශකය - මිනිත්තුවට කිලෝමීටර (km/min)
   4. සාපේක්ෂ ආර්ද්‍රතාවය - තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය - ප්‍රතිශතය (%)
   5. ආලෝක තීව්‍රතාවය - සූර්ය දීප්තමානය - පැය (hours)

4. ශාකවල පුෂ්පීකරණය උත්තේජනයට බලපාන හෝර්මෝනය වන්නේ,
   1. පයිටක්‍රෝම්
   2. සයිටොකයනීන්
   3. ෆ්ලෝරිජීන්
   4. ක්ලෝරෆිල්
   5. කාබොක්සිලේස්

5. පසක භෂ්ම සංතෘප්තිය පසෙහි රසායනික ගුණාංග පිළිඹිබු කරයි. පසක භෂ්ම සංතෘප්තතා ප්‍රතිශතය 30% නම්, එම පස,
   1. සාරවත් පසකි.
   2. බෝගවලට අත්‍යවශ්‍ය මහා පෝෂක බහුලය.
   3. ඇලුමිනියම් හා හයිඩ්‍රජන් අයන අඩුය.
   4. ආම්ලික පසකි.
   5. පෝෂක සුලභතාව ඉහළය.

6. පාංශු බනිජ පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - පාංශු වයනය කෙරෙහි බනිජ බලපායි.
B - 2:1 අනුපාතය ඇති මැටි බනිජ මැනවින් ජලය උරාගනී.
C - විෂමජාතීය අකාබනික ද්‍රව්‍ය වේ.
මින් වඩාත් නිවැරදි වන්නේ,
1. A පමණි. 2. B පමණි. 3. A හා B පමණි.
4. B හා C පමණි. 5. A ,B හා C යන සියල්ලම.

පහත වයන ත්‍රිකෝණය උපයෝගී කර ගන්න.



Clay	- මැටි
Sandy clay	- වැලිලෝම
Sandy clay loam	- වැලි මැටි ලෝම
Sandy loam	- වැලි ලෝම
Loamy sand	- ලෝම වැලි
Sand	- වැලි
Clay loam	- මැටි ලෝම
Loam	- ලෝම
Salty clay	- රොන්මඩ මැටි
Salty clay loam	- රොන්මඩ මැටි ලෝම
Silt loam	- රොන්මඩ ලෝම
Silt	- රොන්මඩ

7. මැටි 35% , රොන්මඩ 52% , වැලි 13% වූ පාංශු නියැදියක වයන පන්තිය වූයේ,
1. වැලිමය මැටි ලෝම පසකි. 2. රොන්මඩ මැටි ලෝම පසකි. 3. වැලිමය මැටි පසකි.
4. ලෝම වැලි පසකි. 5. රොන්මඩ ලෝම පසකි.

8. විද්‍යාගාරය තුලදී පාංශු තෙතමනය නිර්ණය කල හැකි ක්‍රමයක් වන්නේ,
1. ජීප්සම් කුට්ටි ක්‍රමය. 2. ක්ෂේත්‍ර ආතතිමාන ක්‍රමය. 3. භාරමිතික ක්‍රමය.
4. සවිවර කුට්ටි ක්‍රමය. 5. ද්‍රවමාන ක්‍රමය.

9. "සම්පූර්ණ පොහොර" ලෙස හඳුන්වන පොහොර මිශ්‍රණයක අඩංගු මහා පෝෂක තුන වන්නේ,
1. N , P , Ca 2. N , K , P 3. P , K , S
4. Ca , Mg , S 5. ඉහත සියල්ලම.

10. පොස්පරස් චලනාව වැඩිකරන ජෛව පොහොර සෑදීමට භාවිතා කරන ක්ෂුද්‍ර ජීවියා වන්නේ,
1. Bacillus 2. Pseudomonas 3. Aspergillus
4. Mycorrhizal 5. Penicillium

11. පාංශු ආකලන පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - පාංශු ව්‍යුහය හා වයනය දියුණු කිරීම සඳහා පසට ආකලන ද්‍රව්‍ය එකතු කරයි.
B - පාංශු ආකලන මගින් පසෙහි රඳවාගත හැකි පෝෂක ප්‍රමාණය වැඩි වී ශාක ඌනතා ලක්ෂණ මඟ හරියි.
1. A සත්‍ය වේ. B සත්‍ය වේ. A මගින් B පැහැදිලි කරයි.
2. A සත්‍ය වේ. B සත්‍ය වේ. A මගින් B පැහැදිලි නොකරයි.
3. A සත්‍ය වේ. B අසත්‍ය වේ.
4. A අසත්‍ය වේ. B සත්‍ය වේ.
5.A හා B වගන්ති දෙකම අසත්‍ය වේ.

12. මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක වන්නේ,
1. ප්‍රාථමික බිම් සැකසීම හා පාත්ති දැමීමය.
2. ප්‍රාථමික බිම් සැකසීම හා අතුරුයත් ගැමය.
3. ප්‍රාථමික බිම් සැකසීම හා ද්විතියික බිම් සැකසීම ය.
4. ද්විතියික බිම් සැකසීම හා මට්ටම් කිරීමය.
5. ද්විතියික බිම් සැකසීම හා පාත්ති දැමීමය.

13.



මෙම උපකරණය භාවිත කරන බිම් සැකසීමේ අවස්ථාව වනුයේ,
1. ප්‍රාථමික බිම් සැකසීමේ දී ය.
2. ශූන්‍ය බිම් සැකසීමේ දී ය.
3. අවම බිම් සැකසීමේ දී ය.
4. ද්විතියික බිම් සැකසීමේ දී ය.
5. යටි පස බුරුල් කිරීමේ දී ය.

14. බඩ ඉරිහු බෝගය සඳහා පහත ලබාදී ඇති දත්ත ඇසුරින් ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය ගණනය කරන්න.

බෝගයේ මුල පද්ධතියේ ගැඹුර = 80cm
පසේ දෘශ්‍ය ඝනත්වය = 1.6 g/cm^3
ජලය සපයන විට පසේ තෙතමන ප්‍රතිශතය = 10%
ක්ෂේත්‍ර ධාරිතාවේ දී පසේ තෙතමන ප්‍රතිශතය = 20%

1. 8cm
2. 12.8cm
3. 16.2cm
4. 20cm
5. 25.6cm

15. ආටිසියානු ළිං පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
1. බොහෝවිට උණුසුම් ලවණ මිශ්‍ර වූ ජලය පවතින නිසා බෝග වලට හානිවේ.
2. වියළි කලාපයේ හා තෙත් කලාපයේ උස්බිම් වලට ජලය ලබා ගනී.
3. සුළු පරිමාණ ගොවිපලවල් සඳහා බහුලව භාවිත වේ.
4. අපාරගම්‍ය ස්ථරයක් මත අධික පීඩනයකින් ජලය සංචිතව පවතී.
5. කඳුකර ජලාධාරා ප්‍රදේශවල ජල සංචායකයේ පෝෂිත ප්‍රදේශ පවතී.

16. බීජ හා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. මේවා අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1.බීජයක ඇති කළලය බීජ මූලය, බීජෝපරිය, බීජ පත්‍ර හා භ්‍රෑණපෝෂණ යන කොටස් වලින් සමන්විත වේ.
2.පරිණත ඒක බීජ පත්‍රී බීජයක භ්‍රෑණපෝෂය කැපී පෙනෙන මුත් ද්වී බීජ පත්‍රී බීජයක එය ක්ෂීණ වී ඇත.
3.ද්වී බීජ පත්‍රී බීජයක බීජ පත්‍ර කැපී පෙනෙන මුත් කළලයට ආහාර සැපයීමේ කාර්යය භ්‍රෑණපෝෂය මගින් සිදු කෙරේ.
4.ඒක බීජ පත්‍රී බීජයක බීජාවරණය හා ඵලාවරණය වෙන් ව දක්නට ලැබේ.
5.බොහෝ ඒක බීජ පත්‍රී ඵල තුළ බීජ කිහිපයක් පවතින මුත් ද්වී බීජ පත්‍රී ඵල තුළ බීජ රැසක් පවතී.

17. බීජවල භෞතික පාරිශුද්ධතාව සෙවීමේ දී, ශුද්ධ බීජ ලෙස සළකනු ලබන්නේ,
1. රෝගී බීජ
2. අපරිණත බීජ
3. වල් බීජ
4. කුඩා ලෙස කැඩුණු බීජ
5. හිස් පුෂ්පිකා

18. කිසියම් බීජ නියැදියක ආරම්භක බර ග්‍රෑම් x වේ. එම බීජ නියැදිය සම්පූර්ණ ලෙස වියළීමට බඳුන් කළ විට එහි බර ග්‍රෑම් Y වේ.එම බීජ නියදියේ තෙතමන ප්‍රතිශතය වනුයේ,

1. $\frac{(y-x)}{Y} \times 100$
2. $\frac{(x-y)}{y} \times 100$
3. $\frac{(x-y)}{x} \times 100$
4. $\frac{(y-x)}{X} \times 100$
5. $\frac{y}{X} \times 100$

19. යම් ශාක කොටසක් කැම්බියම තෙක් යෙදූ කැපුම නිසා අවට සෛල වල C:N අනුපාතය හා හෝමෝන සාන්ද්‍රනය වැඩි වී ඒ අවට විශේෂණය නොවූ සෛල පස හා ජලය ගැටීම නිසා අවශෝෂණ කෘත්‍ය ඉටු කිරීමේ ව්‍යුහයක් බවට පත්වේ. මේ විද්‍යාත්මක මූලධර්මය උපයෝගී කර ගන්නා ශාක ප්‍රචාරණ ක්‍රමය වනුයේ,
1. බද්ධ කිරීම යි. 2. ලේයර් කිරීම යි. 3. අතු පැළ කිරීමේ දී ය.
4. පත්‍ර කැබලි පැළ කිරීමේ දී ය. 5. මුල් කැබලි පැළ කිරීමේදී ය.

20. වෛරස් ආසාදිත මව් ශාකයකින් නිරෝගී පැළ ලබාගැනීමට වඩාත් සුදුසු ශාක ප්‍රචාරණ ක්‍රමය වනුයේ,
1. බද්ධ කිරීමයි. 2. ලේයර් කිරීමෙනි.
3. ක්ෂුද්‍ර ප්‍රචාරණයෙනි. 4. අත්තක් පැළ කිරීමෙනි.
5. පත්‍ර මගින් පැළ ලබා ගැනීමෙනි.

21. GM ආහාර නිෂ්පාදනයේ දී යොදාගනු ලබන තාක්ෂණය වනුයේ,
1. නුමුහුන් පෙළ වරණය යි. 2. දෙමුහුම් අභිජනනය යි. 3. විකෘති අභිජනනය යි.
4. ජාන තාක්ෂණය යි. 5. සමූහ වරණය යි.

22. නිර්පාංශු වගාවේ දී ඝන මාධ්‍ය තුල සිදු කරන වගා ආකාරයක් වන්නේ,
1. මුල් ගිල්වූ වගාව 2. කේශික අවශෝෂණ වගාව
3. වගා මළු තුළ වගාව 4. ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය
5. පෝෂක ද්‍රාවණ පටල තාක්ෂණය.

23. ජෛව විද්‍යාත්මක පළිබෝධ කළමනාකරණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ජෛව පාලන කාරකයන් ලෙස පරපෝෂිතයන්, විලෝපිකයන් හා ව්‍යාධිජනකයින් යොදා ගනියි.
B - වෙනත් පරපෝෂිතයන්ගෙන් හා විලෝපිකයන්ගෙන් ජෛව පාලන කාරකයන් නිදහස් විය යුතුය.
C - ජීවීන්ගේ හෝමෝන ද පළිබෝධ කළමනාකරණය සඳහා යොදා ගැනේ.
මෙහිදී සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A හා B පමණි. 5. B හා C පමණි.

24. පළිබෝධ ගහන විචලතා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. මින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
A - ජීවී ගහන ඝනත්වය ආර්ථිකව හානියක් සිදු කළ හැකි මට්ටමට පැමිණි විට එම තත්ත්වය වසංගත තත්වයක් ලෙස සලකයි.
B - යම් වගාවක ආර්ථික හානිදායි මට්ටමේ දී පළිබෝධ පාලනය කිරීමට වැයවන වියදම, එම පළිබෝධකගේ හානිය නිසා සිදුවන අලාභයට වඩා වැඩිය.
C- පළිබෝධ පාලන ක්‍රම ඇරඹිය යුතු උපරිම ගහන ඝනත්වය ආර්ථික දේහලීය මට්ටම වේ.
1. A පමණි 2. B පමණි 3. C පමණි
4. A හා B පමණි 5. B හා C පමණි

25. මයිටා හානියට ලක් වූ බෝග වගා ක්ෂේත්‍රයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1. පුෂ්ප හා ඵල කොටස් ආහාරයට ගැනීම. 2. පත්‍ර දාරය යටි අතට හැකිළීම.
3. ශාක මතුපිට පමණක් සුරා තිබීම. 3. කඳ සිදුරුකර අභ්‍යන්තර කොටස් කා දැමීම.
5. පත්‍ර කොටස් කා දැමීම හෝ කපා දැමීම.

26. පහත සඳහන් කෘමි ගෝත්‍ර අතරින් හපන හා විකන මුඛ උපාංග දරන අසම්පූර්ණ රූපාන්තරණයක් ඇති, පූර්ව පියාපත් යුගළ ඒකාකරව ඝන වූ (tagmina) ගෝත්‍රය වනුයේ,
1. තයිසනොප්ටෙරා 2. අයිසොප්ටෙරා 3. ඕතොප්ටෙරා
4. හෝමොප්ටෙරා 5. හෙමිප්ටෙරා

27. ශාක කිහිපයක දක්නට ලැබුනු විවිධ රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - මෘදු කුණු වීම. B - ප්‍රාදේශික පුල්ලි ඇති වීම. C - විචිත්‍රය ඇත.
D - කුඩා ඵල හා පත්‍ර E - ශාක මැලවීම.
ඉහත ලක්ෂණ අතුරින් ELIZA පරීක්ෂණයට භාජනය කිරීමෙන් හඳුනාගත හැකි රෝග කාරකයාට ගැලපෙන රෝග ලක්ෂණය වන්නේ,
1. A 2. B 3. C 4. D 5. E


28. ශාකයක K^+ මගින් සිදුකෙරෙන කාර්යයක් වන්නේ,
1. ප්ලෝයමීය පරිසංක්‍රමණය 2. පූටිකා චලනය 3. ශ්වසනය
4. ප්‍රභසංශ්ලේෂණය 5. වර්ණක සංශ්ලේෂණය

29. පුද්ගලයකු පෙන්නුම් කරන ලද සෞඛ්‍ය ගැටලු කිහිපයක් පහත දැක්වේ.
A - දියවැඩියාවට ගොදුරුවීමේ හැකියාව ඇත.
B - ආර්තව චෙනස්කම් ඇති වේ.
C - කිරීටක හෘද රෝග තත්ත්ව ඇති වේ.
ඉහත ප්‍රකාශ අතුරින් ශරීර ස්කන්ධ දර්ශකය 30 ඉක්මවූ පුද්ගලයකුට අදාල වන්නේ,
1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. A,B,C සියල්ලය.

30. ආහාර කර්මාන්තයේ දී වැදගත් වන ප්‍රමිතීන් අතුරින් ආහාරයකට ගොවිබිමේ සිට කර්මාන්ත ශාලාව දක්වා අහිතකර ද්‍රව්‍ය එකතුවීම වැළැක්වීමට අදාල වන පද්ධති ප්‍රමිතිය වන්නේ,
1. HACCP 2. GMP 3. GAP 4.SLS 5. ISO

31. අස්වනුවල පරිණතබව නිර්ණය කිරීමට යොදා ගන්නා රසායනික සාධකයක් වන්නේ,
1. විශිෂ්ට ගුරුත්වය 2. තෙල් ප්‍රමාණය 3. එතිලීන් ප්‍රමාණය
4. ශ්වසන වේගය 5. අස්වැන්නේ වයස

32. පහත දක්වා ඇත්තේ පලතුරු ඉදීමේදි කාලයත් සමග ශ්වසන වේගය වෙනස්වන ආකාරය පෙන්වන ප්‍රස්තාරයක රූප සටහනයි.



මින් පෙන්වනුයේ,
1. අන්ත උපරිමය පෙන්වන පළතුරු වේ. උදා: අන්නාසි
2. අන්ත උපරිමය පෙන්වන පළතුරු වේ. උදා: ඇපල්
3. අන්ත උපරිමය නොපෙන්වන පළතුරු වේ. උදා: අන්නාසි
4. අන්ත උපරිමය පෙන්වන පළතුරු වේ. උදා: මිදි
5 .අන්ත උපරිමය නොපෙන්වන පළතුරු වේ. උදා: පෙයාර්ස්

33.අධික උෂ්ණත්වය හේතුවෙන් ගොවිපළ සතුන්ගේ සිදුවිය හැකි කායික වෙනසක් නොවන්නේ,
1. දෙනුන්ගේ මද කාලය අඩුවීම හා මද ලක්ෂණ පැහැදිලි නොවීම.
2. සතුන්ගේ බෙට ස්‍රාවය වැඩි වේ.
3. සතුන් ගන්නා ආහාර ප්‍රමාණය වැඩි වේ.
4. නිෂ්පාදන අඩු වේ.
5. සතුන්ගේ සඵලතාව අඩු වේ.

34. කුකුළාගේ ජීර්ණ පද්ධතියේ පූර්ව ආමාශය මගින්,
1. HCI හා ඇමයිලේස් ස්‍රාවය වේ.
2. ට්‍රිප්සින් හා ඇමයිලේස් ස්‍රාවය වීම සිදු වේ.
3. HCI හා පෙප්සින් ස්‍රාවය වීම සිදු වේ.
4. මෝල්ටෝස් හා පෙප්සින් ස්‍රාවය වීම සිදු වේ.
5. HCI හා ට්‍රිප්සින් ස්‍රාවය වීම සිදු වේ.

35. වැඩුණු ගවයෙකුගේ මුඛය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. යටි හනුවේ කෘන්තක දත් නොමැති අතර උඩු හනුවේ ඇත.
2. මුඛයේ බෙට ග්‍රන්ථී නොපිහිටන අතර වමාරා කෑම සිදු වේ.
3. චලනය කළ හැකි තොල් වලින් හා සවිමත් පේෂි වලින් යුක්ත වේ.
4. අස්ථීමය වැටි සහිත විශාල චාර්වක දත් හනු දෙකෙහිම පිහිටයි.
5. රළු කොරොස් දිවක් පිහිටන අතර ශ්ලේෂමල පටල අඩංගු නොවේ.

36. වැඩුණු ගවයෙකුගේ සංකීර්ණ ආමාශය පිළිබඳව නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
A. කුඩාම කොටස වන බහුනැමියෙහි අභ්‍යන්තරය පොතක පිටු ආකාරයෙන් පිහිටා ඇත.
B. විශාලතම කොටස වන රුමනයේ ජීර්ණ එන්සයිම නිපදවන ග්‍රන්ථී නොපිහිටයි.
C. ග්‍රන්ථීමය ස්වභාවයක් ගන්නා ජඨරාශය මගින් ඛනිජ ප්‍රතිශෝෂණය කෙරේ.
D. විතංශිකාවේ අභ්‍යන්තර බිත්තියේ ෂඩස්‍රාකාර ව්‍යූහයන් පිහිටා ඇත.

1. A පමණි 2. B පමණි. 3. A හා C පමණි.
4. B හා D පමණි. 5. A, B හා C පමණි.

37. කිරි දෙවීමේදී එළදෙන උත්තේජනය කර මිනිත්තු 6-8ක් තුළ කිරි දෙවීම අවසන් කළ යුතු වන්නේ,
1. ඔක්සිටොසින් හෝමෝනයේ ක්‍රියාකාරිත්වය මිනිත්තු 6-8ක් තුළ අවසන් වන බැවිනි.
2. කිරි ස්‍රාවය සඳහා වැදගත් වන ප්‍රෝලැක්ටින්වල ක්‍රියාකාරිත්වය මිනිත්තු 6-8ක් තුළ අවසන් වන බැවිනි.
3. ඇඩ්‍රිනලීන් හෝමෝන ස්‍රාවය මිනිත්තු 6-8ක් තුළ අවසන් වන බැවිනි.
4. වැඩි කාලයක් ගත වීමේදී කිරි නරක් විය හැකි බැවිනි.
5. මිනිත්තු 6-8කට වඩා ගත වීමේදී කිරිවල ගුණාත්මක බව අඩුවන බැවිනි.

38. කුකුළු පාලනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. බ්‍රොයිලර් සතුන් සාමාන්‍යයෙන් සූක්ෂම ආකාරයට ඇති කරයි.
B. බෘඩරය තුළ පළමු සතිය තුළ 35^0C පමණ උෂ්ණත්වය සපයා පසුව ක්‍රමයෙන් කාමර උෂ්ණත්වය තෙක් අඩු කරනු ලැබේ.
C. ඝන අස්තරණ ක්‍රමයේදී නිවාසය තුළ 10cm පමණ ඝනකම් අතුරනුවක් පවත්වා ගත යුතුය.
D. සියලුම සතුන්ට උපතේදී මරෙක්ස් එන්නත ලබාදිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
1. A, B හා C පමණි. 2. B, C හා D පමණි.
3. A, C හා D පමණි. 4. A, B හා D පමණි.
5. ඉහත සියල්ලම.

39. එක්තරා සත්ත්ව ආහාරයක දළ තන්තු ප්‍රමාණය 18%ට වැඩිය. දළ ප්‍රෝටීන 30% වැඩි ප්‍රමාණයක් ඇති මෙම ආහාරය සතා විසින් උලා කනු ලැබේ. මෙම ආහාරය විය හැක්කේ,
1. ග්ලිරිසීඩියා 2. පියුරේරියා 3. පැන්ගෝලා
4. බ්‍රැකේරියා 5. ගිනි තෘණ

40. කුකුළන්ට වැළදෙන ආසාදිත නොවන රෝගයකි,
1. පුල්ලෝරම් 2. ගම්බෝරෝ 3. කොක්සිඩියෝසිස්
4. පණු රෝග 5. කකුල් කොරවීම

41.එක්තරා ආයතනයක පිරිවැය ශ්‍රිතය පහත දැක්වේ.

$TC = 8000 + 160Q + 0.02Q^2$

TC = මුළු පිරිවැය

Q = නිමැවුම් ප්‍රමාණය

ඉහත ආයතනයේ මුලු විචල්‍ය පිරිවැය වන්නේ,

1. $160 + 0.02Q$
2. $160Q + 0.02Q^2$
3. $160 + 0.02Q^2$
4. $0.02Q^2$
5. $80Q + 0.01Q^2$

42. එක්තරා වෙළඳපොළ ව්‍යුහයක ලක්ෂණ පහත දැක්වේ.

A. වෙළඳපොළට පිවිසුම හා පිටවීම සඳහා බාධා තිබීම.

B. භාණ්ඩ සඳහා ආදේශක නොමැති වීම.

C. අධි ප්‍රමාණික ලාභ අඛණ්ඩව පැවතීම.

මෙම වෙළඳපොළ ව්‍යුහය විය හැක්කේ,


1. පූර්ණ තරගකාරී වෙළඳපොළ
2. ඒකාධිකාරී වෙළඳපොළ
3. කතිපයාධිකාරී වෙළඳපොළ
4. ඒකාධිකාරී තරග වෙළඳපොළ
5. ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළ

43. නිෂ්පාදන ආර්ථික විද්‍යාවේදී භාවිත වන විවිධ නිෂ්පාදන සම්බන්ධතා සහ ඒ එක් එක් සම්බන්ධතාවයේදී භාවිත වන වක්‍ර නිවැරදිව දක්වා ඇත්තේ,


1. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව - සම නිෂ්පාදන වක්‍රය හා සම පිරිවැය වක්‍රය
2. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව -නිෂ්පාදන හැකියා වක්‍රය හා සම පිරිවැය වක්‍රය
3. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව - නිෂ්පාදන හැකියා වක්‍රය හා සම ආදායම් වක්‍රය
4. නිමැවුම් - නිමැවුම් සම්බන්ධතාව - සම නිෂ්පාදන වක්‍රය හා සම පිරිවැය වක්‍රය
5. නිමැවුම් - නිමැවුම් සම්බන්ධතාව - නිෂ්පාදන හැකියා වක්‍රය හා සම පිරිවැය වක්‍රය

44. පහත දී ඇති ඉල්ලුම් වක්‍ර අතරින් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා අදාළ වන ප්‍රස්ථාරය තෝරන්න.


1.




2.




3.



4.



5.



45. රජය මගින් වී සඳහා වෙළඳපොළ සහතික මිලක් පැනවීමට නිසා ඇතිවිය හැකි තත්වයක් නොවන්නේ,

1. වෙළඳපොළ තුළ වී අධි සැපයුමක් ඇති වීම.
2. රජය විසින් වී තොග රැස් කිරීම.
3. වෙළඳපොළ සහල් මිල ඉහල යාම.
4. වී නිෂ්පාදකයින්ට සාධාරණයක් ඉටු වීම.
5. මෝල් හිමියන්ට අඩු මිලකට වී මිලදී ගත හැකි වීම.

46. ජෛව ගතික ගොවිතැනේදී යොදා ගන්නා මූලධර්මයක් නොවන්නේ,
1. ශාක විවිධත්වය 2. සත්ත්ව විවිධත්වය 3. හෝමියෝපති ද්‍රාවණ
4. ජෛව බලය 5. අවශ්‍යතාවයට පමණක් රසායනික පොහොර භාවිතය.

47. කඩින් කඩ බෝග වගාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. එක් බෝගයක වර්ධන අවධිය අවසන් වීමට පෙර තවත් බෝගයක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරයි.
B. වර්ෂයකට බෝග වගා කරන වාර ගණන වැඩි වේ.
C. අතුරු යත් ගෑම හා අස්වනු නෙළීම වඩාත් පහසුය.

මින් සත්‍ය වන්නේ,
1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A හා B පමණි. 5. B හා C පමණි.

48. කෘෂිකර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් අතර දක්නට ලැබෙන රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. විජලනය B. අධ්‍යාතතිය
C. අභිස්පන්දනය D. කරකැවිල්ල හා ක්ලාන්තය
E. නීල වර්ණතාව

මින් අධික උෂ්ණත්වය සහිත ස්ථානයක කෘෂිකාර්මික කටයුතුවල නිරත වීම නිසා ඇති විය හැකි තත්ත්ව වන්නේ,
1. A,B,C 2. B,C,D 3. C,D,E
4. A,D,E 5. B,D,E

49. දේශගුණික විපර්යාස පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය වන්නේ,
1. මේ සදහා ස්වභාවික ක්‍රියාදාම හා මිනිසාගේ ක්‍රියාකාරකම් දායක වේ.
2. ස්වභාවික හරිතාගාර ආවරණයද මෙයට ප්‍රධාන හේතුවකි
3. ගෝලීය උෂ්ණත්වය ඉහල යාම මෙහි ප්‍රධාන ලක්ෂණයකි.
4. මෙය ජල චක්‍රයේ අසමතුලිතතා ඇති කිරීම නිසා දීර්ඝ නියං, අධික්‍රීව වැසි ආදිය ඇති වේ.
5. පොසිල ඉන්ධන දහනය, වන හරණය, කාර්මීකරණය වැනි කරුණු ද දේශගුණික විපර්යාස ඇති වීමට බලපායි.

50. ජාන සම්පත් විනාශ වීම කෙරෙහි බලපාන සාධක අතුරින් මිනිස් ක්‍රියාකාරකම්වල අවම දායකත්වයක් පෙන්නුම් කරනුයේ,
1. ජීවීන් සදහා පවතින වාසස්ථාන වෙනස් කිරීමෙනි.
2. පරිසරයට ආගන්තුක ජීවීන් හදුන්වා දීමෙනි.
3. භූමිකම්පා ඇති වීමෙනි.
4. ජාන සම්පත් වෙළදාම මගිනි.
5. පරිසරය දූෂණය මගිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level), Grade 13, Final Term Test - 2025

කෘෂි විද්‍යාව II **Agricultural Science II**	**08**	**S**	**II**	**පැය තුනයි** **Three hour**

අතිරේක කියවීම් කාලය : මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නම්:.....

වැදගත්:

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 10 කින් යුක්ත අතර
- A සහ B යන කොටස් දෙකකින් යුත්ත වේ.කොටස් දෙකට ම නියමිත කාලය පැය තුනයි.

A කොටස - ව්‍යුහගත රචනා (පිටු 2 -9)

- සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස - රචනා (පිටු 10)

- මෙම මෙම කොටස ප්‍රශ්න හයකින් සමන්විත වන අතර ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A හා B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස B කොටසට උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට බාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

දෙවනි පත්‍රය සඳහා		
කොටස	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
A	01	
	02	
	03	
	04	
B	05	
	06	
	07	
	08	
	09	
	10	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරෙන්	

අත්සන

උත්තර පත්‍ර පරීක්ෂක	
අධීක්ෂණය කලේ	

A කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100කි.)

01. A. රටක දළ දේශීය නිෂ්පාදනයට දායක වන අංශ කිහිපයකි.

I. වර්තමාන ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට දායක වන ප්‍රධාන අංශ තුන සඳහන් කරන්න.
1..... 2..... 3.....

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය/අසත්‍ය දැයි සඳහන් කරන්න.

a. 1978 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා පිරිවැය මත පදනම් වූ කෘෂි සැලසුම් ඇති විය. ……...

b. බිසෝකොටුව මඟින් වැවට එකතුවන රොන්මඩ පිට කිරීම සිදුකරයි.....

c. "රඹකැන් ඔය" ශ්‍රී ලංකාව තුළ මැතකදී ක්‍රියාවට නංවන ලද බහුකාර්ය සංවර්ධන යොජනා ක්‍රමයකි.....

d. කෘෂි යෙදවුම් හා සේවාවන් සපයාදීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන වගකීම වේ.....

e. ශ්‍රී ලංකාවේ නවීන වාණිජ කෘෂිකර්මාන්තය තුළ කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයට නැඹුරු වී ඇත.....

B. පාංශු සංඝටකයන්හි පරිමාව හා ස්කන්ධය පහත පරිදි වේ.

උදුනේ වියලූ පසු පස්වල ස්කන්ධය	= 320g
පාංශු ජලයේ ස්කන්ධය	= 90g
පාංශු ඝන කොටසේ පරිමාව	= 105cm^3
පාංශු වාතයේ පරිමාව	= 45 cm^3

සැ.යු - පාංශු ජලයේ ඝනත්වය ඝන සෙන්ටිමීටරයට ග්‍රෑම් 1 gcm^{-3}

I. පාංශු ජල ප්‍රතිශතය ගණනය කරන්න.

.....

.....

II. පසේ දෘශ්‍ය ඝනත්වය ගණනය කරන්න.

.....

.....

III. පසේ සත්‍ය ඝනත්වය ගණනය කරන්න.

.....

.....

C. I. ශාකයක උත්තනා ලක්ෂණ ඇතිවන ආකාරය අනුව අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය බෙදා දැක්විය හැකි ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න.
1..... 2.....

II. පහත සඳහන් මූලද්‍රව්‍ය ශාක අවශෝෂණය කරනු ලබන ප්‍රධාන ආකාරය සඳහන් කරන්න.
1 නයිට්‍රජන්..... 2.පොස්පරස්.....

3.පොටෑසියම්.....

III. පොහොර භාවිතය පිළිබඳ 4R සංකල්පය සඳහන් කරන්න.
1..... 2.....

3..... 4.....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

IV. පහත එක් එක් පෝෂකය ලබාදීම සඳහා පසට යෙදිය හැකි සෘජු රසායනික පොහොර වර්ගයක් නම් කරන්න.

1. නයිට්‍රජන්.....
2. පොස්පරස්.....
3. පොටෑසියම්.....

D. ශ්වසනය යනු කාබනික සංයෝග එන්සයිමීය ප්‍රතික්‍රියා ශ්‍රේණියක් මඟින් බිඳ හෙළීමෙන් ශක්තිය ලබා ගැනීමේ ක්‍රියාවලියයි.

I. ශ්වසනයේදී වඩාත් බහුල ලෙස භාවිතා කරන ශ්වසන උපස්ථරය සඳහන් කරන්න.

.....

II. ශ්වසන යාන්ත්‍රනයේ පියවර තුන සඳහන් කරන්න.


1..... 2..... 3.....

III. කෘෂිකාර්මික කටයුතු වලදී ශ්වසන ක්‍රියාවලිය වේගවත් කර ගන්නා අවස්ථා දෙකක් සඳහන් කරන්න.

1.....

2.....

E.



ඉහත දක්වා ඇත්තේ ගොවිපොළක තෘණ නිෂ්පාදනය හා සතුන්ගේ ආහාර අවශ්‍යතාව කාලයත් සමඟ විචලනය වන ආකාරයයි.

I. ඉහත ප්‍රස්තාරයේ ගොවිපොළ සතුන්ගේ ආහාර අවශ්‍යතාව පිළිබඳ සළකා බැලීමේදී A හා B අවස්ථා වල තෘණ නිෂ්පාදනය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

A.....

B.....


II. ඉහත ආකාරයට තෘණ නිෂ්පාදනය විචලනය වීමට බලපාන ප්‍රධාන දේශගුණික සාධකය කුමක් ද?

.....

III. ගොවිපොළක තෘණ සංරක්ෂණයේ දී පහත එක් එක් අවස්ථාව යටතේ යෙදාගනු ලබන සංරක්ෂණ ක්‍රමයක් බැගින් නම් කරන්න.

a. වියළි ආකාරයට සංරක්ෂණය.....
b. තෙත් ආකාරයට සංරක්ෂණය.....

F. නිර්පාංශු වගා ආකාරයක් වන මුල් ගිල් වූ වගාව පහත රූපයේ දැක්වේ .



I. පෝෂක ද්‍රාවනයේ හැසිරීම අනුව මුල් ගිල් වූ වගාව අයත් වන්නේ කුමන ජල රෝපිත වගා ආකාරයටද?

.....

II. මෙහි A, B, C, D කොටස් නම් කරන්න

A–……..... B…….

C……..... D…….....

02. A. කෘෂි ක්ෂේත්‍රයේ ආයෝජන සාර්ථක කර ගැනීම සඳහා දේශගුණික හා පාරිසරික සාධක පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

I. ශ්‍රී ලංකාව දේශගුණික කලාපවලට බෙදීමේ දී සලකා බලන ලද ප්‍රධාන දේශගුණික සාධකය සඳහන් කරන්න.

…….....

II. ඔබ ඉහත (I)හි සඳහන් කළ දේශගුණික සාධකයට අනුව ශ්‍රී ලංකාව බෙදා ඇති කලාප තුන සඳහන් කරන්න.

1..... 2..... 3.....

III. හිස්තැන් පුරවන්න.

ශ්‍රී ලංකාව කෘෂි දේශගුණික කලාප ..... කට බෙදා ඇති අතර, වියලි කලාපය සම්පූර්ණයෙන්ම ..... කෘෂි දේශගුණික කලාපයේ පමණක් පැතිරී ඇත.

IV. විවිධ ප්‍රදේශවල උෂ්ණත්වයේ දෛනික විචලනයට හේතු දෙකක් සඳහන් කරන්න.

1.....

2.....

V. ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රදේශයක පැතිරී ඇති පස් කාණ්ඩය සඳහන් කරන්න.

.....

B. ගහනයක ලක්ෂණ වැඩි දියුණු කිරීමේ දී නව ප්‍රභේදන ඇති වන අවස්ථාවක් පහත දැක්වේ. මෙහි දී ඵලයේ රසවත් බව (A) හා විශාල ඵල (B) යන ලක්ෂණ ප්‍රමුඛ වේ.

රසවත් කුඩා ඵල × ඇඹුල් විශාල ඵල - P_1

↓

රසවත් විශාල පැළ - F_1

100%

I. ඉහත දැක්වෙන ආකාරයට නව ප්‍රභේදන ඇති වන අභිජනන ක්‍රමය නම් කරන්න.

.....

II. F_1 පරම්පරාවේ දී ජනිතයින් තුළ ඇති වන වාසිදායක තත්ත්වය සඳහන් කරන්න.

.....

III. මෙහි ජනකයන් සතු ප්‍රවේණි දර්ශය සඳහන් කරන්න.

.....

IV. මෙහි දී දෙමාපියන් තුළ අදාළ අපේක්ෂිත ලක්ෂණයට බලපාන ඇලීල.....විය යුතුය.

C.I. පසු අස්වනු හානිය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

……

……

II. බෝගයක පසු අස්වනු හානි සිදුවිය හැකි අවස්ථා තුනක් නම් කරන්න.

1..... 2.....

3.....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

D. කලලයේ ක්‍රියාශීලී වර්ධනය හේතු කොට ගෙන බීජාවරණය පලාගෙන බීජ පැළය මතුවීම බීජ ප්‍රරෝහණය වේ.

I. බීජ ප්‍රරෝහණ ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් සඳහන් කරන්න.

1.....


2.....

3.....

4.....

5.....

E. පහත දැක්වෙන්නේ පලිබෝධ නාශක යෙදීමේ දී වැදගත් වන උපකරණයකි.



I. මෙම උපකරණය කුමක් ද?

.....

II. ඉහත උපකරණයේ පහත කොටස් නම් කරන්න.

A -..... B -.....

C -..... D - .....

III. විසර්ජන හා ඉසීමේ ක්‍රම වලට අමතරව පළිබෝධ නාශක යෙදීමේ වෙනත් ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1..... 2. .....

IV. පළිබෝධ නාශක භාවිතයේ දී හා යෙදීමේ දී පිළිපැදිය යුතු ආරක්ෂණ පිළිවෙත් එකක් ලියන්න.

.....

F. I. පාංශු ප්‍රතික්‍රියාව යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

.....

II. පාංශු ප්‍රතික්‍රියාව නිර්ණය කරනුයේ කෙසේද?

.....

III. පාංශු ප්‍රතික්‍රියාව නිර්ණය කිරීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1.....

2.....


IV. පාංශු ලවණතාව හා ක්ෂාරීයතාවයට බලපාන ප්‍රධාන අයනය සඳහන් කරන්න.

.....

V. ක්ෂාරීය පසක් යථා තත්ත්වයට පත් කළ හැකි ආකාරය සඳහන් කරන්න.

.....

03. A. බෝග වගාවේ දී පළිබෝධ කළමනාකරණය ඉතා වැදගත් වේ. ඒ සඳහා වැදගත් වන ගහන ඝනත්වය අනුව පළිබෝධ හානියේ මට්ටම් හඳුනා ගැනීමේ දී සීමාව ලෙස යොදා ගන්නා කල්පිත ගහන මට්ටම් පෙන්වන ප්‍රස්ථාරයක් පහත දැක්වේ.



I. ඉහත ප්‍රස්ථාරයේ ආර්ථික දේහලීය මට්ටම සහ වඃගත තත්ත්වය හඳුනාගන්න.

1. ආර්ථික දේහලීය මට්ටම - ..... 2. වඃගත තත්ත්වය -.....

II. ක්ෂේත්‍රයේ දී පළිබෝධ ගහන ඝනත්වය තීරණය කිරීමට භාවිත කරන උපකරණය කුමක්ද?

.....

III. ඉහත X තත්ත්වය ඇතිවීමට හේතු දෙකක් සඳහන් කරන්න.

1. ..... 2.....

B. තරගකාරී වෙළඳපළක එක්තරා භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

Qd = 50 - 2p Qd = ඉල්ලුම් ප්‍රමාණය Qs = සැපයුම් ප්‍රමාණය

Qs = 20 + 4p P = මිල (රු)

I. වෙළඳපළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය සොයන්න.

.....

.....

.....

.....

II. මෙම භාණ්ඩය සඳහා රජය විසින් රු.10.00 අවම මිලක් නියම කළ විට ඇතිවන අධි සැපයුම ගණනය කරන්න.

.....

.....

.....

C. සත්ත්ව පාලන ගොවිපළක දක්නට ලැබුණු උපකරණයක් පහත රූපයේ දැක්වේ.



I. එම උපකරණය හඳුනා ගන්න. .....

II. එහි භාවිතය සඳහන් කරන්න.

.....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

III. හිස්තැන් පුරවන්න.

එළකිරිවල සංයුතිය සැලකීමේදී, එහි අඩංගු ප්‍රධානම සංඝටකය වන්නේ.....වේ.

කිරිවල අඩංගු ප්‍රධාන කාබෝහයිඩ්‍රේටය ..... වන අතර එය..... ලෙස හඳුන්වයි.

කිරි වල මේද ප්‍රතිශතය සෙවීම සඳහා බහුලව භාවිතවන ක්‍රමය..... නම් වේ.


කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වලදී කිරිවල විශිෂ්ට ගුරුත්වය මැනීම සඳහා ..... භාවිතාවේ.

D. I. ගොවිපළ සතුන් තුළ දැකිය හැකි ආහාර ජීර්ණ පද්ධති ආකාර දෙකක් නම්කරන්න .

1. .....

2. .....

II. කුකුළාගේ ආහාර මාර්ග පද්ධතියේ රූප සටහනක් පහත දැක්වේ.එහි A, B, C කොටස් නම් කරන්න.



A - .....

B - .....

C - .....

III. ඉහත කොටස් අතරින් ගවයාගේ යාන්ත්‍රික ජීරණය සිදුවන කොටසට කෘත්‍යයෙන් සමාන වන්නේ කුමන කොටසද? .....

IV. රක්කවීමට සුදුසු බිත්තරයක තිබිය යුතු බාහිර ලක්ෂණ දෙකක් නම් කරන්න.

1..... 2.....

E. බෝග වගාවන් සඳහා වර්ෂාවෙන් ලැබෙන ජලය ප්‍රමාණවත් නොවන විටදී කෘතිමව වගා බිම් සඳහා ජලය සැපයිය යුතුය.

I. ජල සම්පාදන ක්‍රමයක් තෝරාගැනීමේ දී සලකා බලන ප්‍රධාන සාධක තුනක් සඳහන් කරන්න.

1..... 2..... 3.....

II. ශ්‍රී ලංකාවේ බහුලව භාවිත වන ජල හානිය අවම වන ජල සම්පාදන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1..... 2.....

III. ජල සම්පාදන ක්‍රම අතරින් පොහොර යෙදීම(Fertigation) සඳහා වඩාත් උචිත වන ජල සම්පාදන ක්‍රමය සඳහන් කරන්න .....

IV. ඉහත (III)හි සඳහන් කරන ලද ජල සම්පාදන ක්‍රමය වඩාත් උචිත යැයි යෝජනා කිරීමට හේතුව සඳහන් කරන්න .....

.....

F. කෘෂි අංශයේ විවිධ අවස්ථාවලදී පුද්ගලයින්ට විවිධ ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ.

I. කෘෂිකර්මාන්තයේ දී ආපදා සිදුවිය හැකි අවස්ථා තුනක් සඳහන් කරන්න.

1..... 2..... 3.....

II. කෘෂිකර්මාන්තය ආශ්‍රිත බහුල සංක්‍රමණික රෝග දෙකක් සඳහන් කරන්න.

1..... 2.....

04. A. බෝග සංස්ථාපනයේදී රෝපණ ද්‍රව්‍ය නිපදවා ගැනීමට බොහෝ අවස්ථාවල තවාන් භාවිතා වේ.

I. පහත තවාන් සඳහා උචිත වන බෝගය බැගින් සඳහන් කරන්න.

1. නොරිඩෝකෝ තවාන - .....

2. වැලි තවාන - .....

3. ඩැපොග් තවාන - .....

4. මඩ තවාන - .....

II. තවාන් දැමීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1.....

2.....

III. තවාන් ජීවානුහරණයේ මූලික අරමුණ සඳහන් කරන්න.

.....


.....

IV. තවාන් ජීවානුහරණය සඳහා භාවිත කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1.....

2.....

B.I කිසියම් භාණ්ඩයක නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ මුළු පිරිවැය (TC), මුළු විචල්‍ය පිරිවැය (TVC) හා මුළු ස්ථාවර පිරිවැය (TFC) වක්‍රවල හැඩයන් පහත ප්‍රස්ථාරයේ ඇඳ දක්වන්න.



II. කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ ප්‍රධාන පියවර හතර සඳහන් කරන්න.

1..... 2.....

3..... 4.....

C. වර්තමානයේදී කෘෂි ක්ෂේත්‍රය විවිධ අභියෝගවලට මුහුණ දී ඇත.

I. වර්තමානයේදී කෘෂි කර්මාන්තය මුහුණපා ඇති ප්‍රධාන අභියෝග දෙකක් සඳහන් කරන්න.

1..... 2.....

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

II. ඉහත ඔබ සඳහන් කළ අභියෝග ජයගැනීම සඳහා උචිත උපායමාර්ග දෙකක් යෝජනා කරන්න.

1.....

2.....

D. ආහාර නරක් වීමට බලපාන සාධක කෘතිමව පාලනය කරමින් ආහාර පරිරක්ෂණය කරනු ලැබේ.

I. ආහාර පරිරක්ෂණ මූලධර්ම දෙකක් සඳහන් කර ඒ සඳහා උදාහරණය බැගින් දෙන්න.

මූලධර්මය	උදාහරණ
1.....	.....
2.....	.....

II. ආහාර පරිරක්ෂණය කිරීමට පෙර සිදුකරන පූර්ව ප්‍රතිකාර ක්‍රමය සඳහන් කරන්න.

.....

III. ඉහත(II) හි සඳහන් පූර්ව ප්‍රතිකාරය භාවිතා කරමින් ආහාර පරිරක්ෂණය සිදුකරන අවස්ථා සඳහා උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න

1..... 2.....

IV. ආහාර සැකසීමේ නව ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න.

1. ..... 2.....

E. I. කිසියම් ශාකයක බීජ සිටුවා ඉන් ලැබෙන පැළ පරම්පරා කිහිපයක් තිස්සේ නිරීක්ෂණය කළ විට බොහොමයක්ම මවුපිය පරම්පරා වල ලක්ෂණ පෙන්නුම් කිරීමක් දක්නට ලැබිණි. එසේ වීමට හේතු විය හැකි තත්ත්වය කුමක්ද? .....

.....

II. ඉහත පිළිතුරට හේතුවන තත්ත්වය පවත්වා ගැනීමට ශාකවල ස්වභාවික ඇති ව්‍යුහාත්මක වෙනස්කමක් දක්වන්න.

.....

III. සිටුවීම සඳහා යොදාගත් ජීව්‍යතාවයෙන් යුත් ගස්ලබු බීජ බොහෝමයක් ප්‍රරෝහණය නොවූ බව ශිෂ්‍යයෙකු පවසන ලදී එසේ වීමට හේතු සඳහන්කරන්න.

.....

IV. එම ප්‍රරෝහණය කරවීම සඳහා කළ යුතු ප්‍රතිකර්මයක් සඳහන් කරන්න.

.....

V. බීජ හැර ශාක ප්‍රචාරණය කිරීමට භාවිත කරන කෘත්‍රිම වර්ධක ප්‍රචාරණ ක්‍රම දෙකක් නම් කරන්න.

1.....

2.....

VI. අලිංගික ශාක ප්‍රචාරණයෙන් ලැබෙන ප්‍රධාන වාසියක් සඳහන් සඳහන් කරන්න.

.....

B කොටස - රචනා

ප්‍රශ්න 04කට පමණක් පිළිතුරු සපයන්න.

5. I. බෝග වගා ක්ෂේත්‍රය දියුණු කිරීමට ශ්‍රී ලංකාව තුළ පවතින විභවය විස්තර කරන්න.

   II. පාංශු ජනනයට බලපාන සාධක විස්තර කරන්න.

   III. වර්ධක යාමක භාවිතය මගින් කෘෂි බෝගවල ඵලදායිතාව වැඩි කළ හැකි ආකාරය විස්තර කරන්න.

6. I. එක් එක් දේශගුණික සාධකය ප්‍රශස්තව නොලැබුණු විට බෝග වගාවට ඇතිවන අහිතකර බලපෑම් විස්තර කරන්න.

   II. පසු අස්වනු හානියට බලපාන පෙර අස්වනු සාධක විස්තර කරන්න.

   III. තවාන් පැළ නඩත්තු කිරීමේදී අනුගමනය කළ යුතු ශිල්පීය ක්‍රම සඳහන් කරන්න.

7. I. පාංශු පෝෂක පසෙන් ඉවත්වන ආකාරය විස්තර කරන්න.

   II. ආහාර නරක් වීමට බලපාන රසායනික සාධක විස්තර කරන්න.

   III .කෘෂි නිෂ්පාදන ක්‍රියාවලියකදී අගයදාම ක්‍රියාවලියේ වැදගත්කම පැහැදිලි කරන්න.

8. I. වගා භූමියක ජල සම්පාදන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ක්‍රම විස්තර කරන්න.

   II. එළදෙනකගේ මද චක්‍රය විස්තර කරන්න.

   III. බෝග වගාවක පළිබෝධ තත්ත්ව ඇතිවීමට හේතු විස්තර කරන්න.

9. I. පටක රෝපණයේදී ජීවානුහරණ ක්‍රියාවලිය සිදුකරන ආකාරය පැහැදිලි කරන්න

   II. පරිබාහිර සංරක්ෂණ ක්‍රමය මගින් ජාන සම්පත් සංරක්ෂණය කරන ආකාරය පැහැදිලි කරන්න.

   III. සත්ත්ව පාලන ගොවිපළක සත්ත්ව රෝග කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

10. I. පාලිත පරිසර තත්ත්ව යටතේ බෝග වගාවේදී විවිධ ආරක්ෂිත ව්‍යුහයන් තුළ වායව පරිසර තත්ත්ව පාලනය කරන ආකාරය පහදන්න.

    II. වර්ෂාපෝෂිත ගොවිතැන් ක්‍රමයේ වාසි හා අවාසි විස්තර කරන්න.

    III. පාංශු සෞඛ්‍යය පිරිහීමට හේතු සඳහන් කරන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

කෘෂි විද්‍යාව

ව්‍යුහගත රචනා - අවසන් වාර

13 ශ්‍රේණිය

01. A. රටක දළ දේශීය නිශ්පාදනයට දායක වන අංශ කිහිපයකි.

I. වර්තමාන ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට දායක වන ප්‍රධාන අංශ තුන සඳහන් කරන්න.

1. කර්මාන්ත අංශය. 2. සේවා අංශය 3. කෘෂිකාර්මික අංශය (ලකුණු 2×3)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය/අසත්‍ය දැයි සඳහන් කරන්න.

a. 1978 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා පිරිවැය මත පදනම් වූ කෘෂි සැලසුම් ඇති විය. සත්‍ය

b. බිසෝකොටුව මඟින් වැවට එකතුවන රොන්මඩ පිට කිරීම සිදුකරයි. අසත්‍ය

c. "රඹකැන් ඔය" ශ්‍රී ලංකාව තුළ මැතකදී ක්‍රියාවට නංවන ලද බහුකාර්ය සංවර්ධන යොජනා ක්‍රමයකි. සත්‍ය

d. කෘෂි යෙදවුම් හා සේවාවන් සපයාදීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන වගකීම වේ. සත්‍ය

e. ශ්‍රී ලංකාවේ නවීන වාණිජ කෘෂිකර්මාන්තය තුළ කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයට නැඹුරු වී ඇත. සත්‍ය

(ලකුණු 2×5=10)

B. පාංශු සංඝටකයන්හි පරිමාව හා ස්කන්ධය පහත පරිදි වේ.

උදුනේ වියලූ පසු පස්වල ස්කන්ධය = 320g

පාංශු ජලයේ ස්කන්ධය = 90g

පාංශු ඝන කොටසේ පරිමාව = $105cm^3$

පාංශු වාතයේ පරිමාව = $45\ cm^3$

සැ.යු - පාංශු ජලයේ ඝනත්වය සහ සෙන්ටිමීටරයට ග්‍රෑම් $1\ gcm^{-3}$

I. පාංශු ජල ප්‍රතිශතය ගණනය කරන්න.

= ජලයේ බර/වියලි ඝන ද්‍රව්‍ය බර ×100

= 90/320 ×100 =28.1%

II. පසේ දෘශ්‍ය ඝනත්වය ගණනය කරන්න.

= පසේ වියළි බර Ms / පසේ මුළු පරිමාව Vt

= 320 / වායු + ජල + පස =320/45+90+105 = $1.33gcm^{-3}$

III. පසේ සත්‍ය ඝනත්වය ගණනය කරන්න.

= ඝන කොටසේ ස්කන්ධය Ms /ඝන කොටසේ පරිමාව Vs

=320/105 =$3gcm^{-3}$ (ලකුණු 4×3=12)

C. I. ශාකයක ඌනතා ලක්ෂණ ඇතිවන ආකාරය අනුව අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය බෙදා දැක්විය හැකි ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න.

1.. චල මූලද්‍රව්‍ය. 2. අචල මූලද්‍රව්‍ය. (ලකුණු 3×2=6)

II. පහත සඳහන් මූලද්‍රව්‍ය ශාක අවශෝෂණය කරනු ලබන ප්‍රධාන ආකාරය සඳහන් කරන්න.

1 නයිට්‍රජන්.NO_3^- ,NH_4^+ 2.පොස්පරස්..$H_2PO_4^-$, HPO_4^{2-}

3.පොටෑසියම් K^+ (ලකුණු 2×3 = 06)

III. පොහොර භාවිතය පිළිබඳ 4R සංකල්පය සඳහන් කරන්න.

1. නියමිත වේලාවට 2. නියමිත ප්‍රමාණයෙන්

3. නියමිත ප්‍රභවයෙන් 4. නියමිත ස්ථානයට (ලකුණු 3×4 = 12)

IV. පහත එක් එක් පෝෂකය ලබාදීම සඳහා පසට යෙදිය හැකි සෘජු රසායනික පොහොර වර්ගයක් නම් කරන්න.

1. නයිට්‍රජන් - යූරියා, ඇමෝනියම් සල්ෆේට්, සෝඩියම් නයිට්‍රේට්

2. පොස්පරස් - සාන්ද්‍ර සුපර් පොස්පේට්, ත්‍රිත්ව සුපර් පොස්පේට්, එප්පා වල ඇපටයිට්, රොක් පොස්පේට්

3. පොටෑසියම් - මියුරේට් ඔෆ් පොටෑෂ්, සල්ෆේට් පොටෑෂ්, KNO3 (ලකුණු 2×3 = 06)


D. ශ්වසනය යනු කාබනික සංයෝග එන්සයිමීය ප්‍රතික්‍රියා ශ්‍රේණියක් මඟින් බිඳ හෙලීමෙන් ශක්තිය ලබා ගැනීමේ ක්‍රියාවලියයි.

I. ශ්වසනයේදී වඩාත් බහුල ලෙස භාවිතා කරන ශ්වසන උපස්ථරය සඳහන් කරන්න.
ග්ලූකෝස් (ලකුණු 3×1 = 3)

II. ශ්වසන යාන්ත්‍රනයේ පියවර තුන සඳහන් කරන්න.
1. ග්ලයිකොලිසිය. 2. ක්‍රෙබ්ස් චක්‍රය. 3. ඉලෙක්ට්‍රෝන පරිවහනය (ලකුණු 2×3 = 6)

III. කෘෂිකාර්මික කටයුතු වලදී ශ්වසන ක්‍රියාවලිය වේගවත් කර ගන්නා අවස්ථා දෙකක් සඳහන් කරන්න.
1. බීජ ප්‍රරෝහණය ඉක්මන් කිරීමට. 2. අතු කැබලි මුල් ඇද්දවීම වේගවත් කිරීමට (ලකුණු 3×2 = 6)

E.



ඉහත දක්වා ඇත්තේ ගොවිපොළක තෘණ නිෂ්පාදනය හා සතුන්ගේ ආහාර අවශ්‍යතාව කාලයත් සමඟ විචලනය වන ආකාරයයි.


I. ඉහත ප්‍රස්තාරයේ ගොවිපොළ සතුන්ගේ ආහාර අවශ්‍යතාව පිළිබඳ සළකා බැලීමේදී A හා B අවස්ථා වල තෘණ නිෂ්පාදනය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.
A - තෘණ හිඟයක් ඇත.

B - තෘණ අතිරික්තයක් ඇත. (ලකුණු 3×2 = 6)

II. ඉහත ආකාරයට තෘණ නිෂ්පාදනය විචලනය වීමට බලපාන ප්‍රධාන දේශගුණික සාධකය කුමක් ද?
වර්ෂාපතනය (ලකුණු 3×1 = 3)

III. ගොවිපොළක තෘණ සංරක්ෂණයේ දී පහත එක් එක් අවස්ථාව යටතේ යෙදාගනු ලබන සංරක්ෂණ ක්‍රමයක් බැගින් නම් කරන්න.
a. වියළි ආකාරයට සංරක්ෂණය - හේ නිෂ්පාදනය
b. තෙත් ආකාරයට සංරක්ෂණය -. සයිලේජ් නිෂ්පාදනය (ලකුණු 3×2 = 6)

F. නිර්පාංශු වගා ආකාරයක් වන මුල් ගිල් වූ වගාව පහත රූපයේ දැක්වේ .



I. පෝෂක ද්‍රාවනයේ හැසිරීම අනුව මුල් ගිල් වූ වගාව අයත් වන්නේ කුමන ජල රෝපිත වගා ආකාරයටද?
සංසරණය නොවන ක්‍රමය (ලකුණු 4×1 = 4)

II. මෙහි A, B, C, D කොටස් නම් කරන්න
A– වා සිදුර B - වාතය අවශෝෂණය කරන මුල් (ලකුණු 2×4 = 8)
C - පෝෂක අවශෝෂණය කරන මුල් D - වගා බඳුන මුළු ලකුණු 100

02. A. කෘෂි ක්ෂේත්‍රයේ ආයෝජන සාර්ථක කර ගැනීම සඳහා දේශගුණික හා පාරිසරික සාධක පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

I. ශ්‍රී ලංකාව දේශගුණික කලාපවලට බෙදීමේ දී සලකා බලන ලද ප්‍රධාන දේශගුණික සාධකය සඳහන් කරන්න.

වාර්ෂික වර්ෂාපතනය (ලකුණු 2×1 = 2)

II. ඔබ ඉහත (I)හි සඳහන් කළ දේශගුණික සාධකයට අනුව ශ්‍රී ලංකාව බෙදා ඇති කලාප තුන සඳහන් කරන්න.

1. තෙත් කලාපය 2. වියලි කලාපය 3. අතරමැදි කලාපය (ලකුණු 3×3 = 9)

III. හිස්තැන් පුරවන්න.

ශ්‍රී ලංකාව කෘෂි දේශගුණික කලාප 07 කට බෙදා ඇති අතර, වියලි කලාපය සම්පූර්ණයෙන්ම පහත රට කෘෂි දේශගුණික කලාපයේ පමණක් පැතිරී ඇත. (ලකුණු 2×2 = 4)

IV. විවිධ ප්‍රදේශවල උෂ්ණත්වයේ දෛනික විචලනයට හේතු දෙකක් සඳහන් කරන්න.

1 - අභ්‍යන්තර ජලාශවල පිහිටීම. *(උච්චත්වය,භූගෝලීය පිහිටීම)

2 - වර්ෂාපතන ව්‍යාප්තිය. *(වෘක්ෂලතා ගහණය,මිනිස් ක්‍රියාකාරකම්) (ලකුණු 2×2 = 4)

V. ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රදේශයක පැතිරී ඇති පස් කාණ්ඩය සඳහන් කරන්න.

රතු දුඹුරු පස (ලකුණු 3×1 = 3)

B. ගහනයක ලක්ෂණ වැඩි දියුණු කිරීමේ දී නව ප්‍රභේදන ඇති වන අවස්ථාවක් පහත දැක්වේ. මෙහි දී ඵලයේ රසවත් බව (A) හා විශාල ඵල (B) යන ලක්ෂණ ප්‍රමුඛ වේ.

රසවත් කුඩා ඵල × ඇඹුල් විශාල ඵල - P_1

↓

රසවත් විශාල පැළ - F_1

100%

I. ඉහත දැක්වෙන ආකාරයට නව ප්‍රභේදන ඇති වන අභිජනන ක්‍රමය නම් කරන්න.

දෙමුහුන් අභිජනනය (ලකුණු 3×1 = 3)

II. F_1 පරම්පරාවේ දී ජනිතයින් තුළ ඇති වන වාසිදායක තත්ත්වය සඳහන් කරන්න.

දෙමුහුම් දිරිය (ලකුණු 3×1 = 3)

III. මෙහි ජනකයන් සතු ප්‍රවේණි දර්ශය සඳහන් කරන්න.

AAbb සහ aaBB (ලකුණු 3×2 = 6)

IV. මෙහි දී දෙමාපියන් තුළ අදාළ අපේක්ෂිත ලක්ෂණයට බලපාන ඇලීල සමයුග්මක විය යුතුය. (ලකුණු 3×1 = 3)

C.I. පසු අස්වනු හානිය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

අස්වනු නෙළීමේ සිට පාරිභෝගිකයා අතට පත්වන තෙක් විවිධ අවස්ථාවලදී අස්වැන්නට සිදුවන ප්‍රමාණාත්මක හා ගුණාත්මක හානි වේ. (ලකුණු 4×1 = 4)

II. බෝගයක පසු අස්වනු හානි සිදුවිය හැකි අවස්ථා තුනක් නම් කරන්න.

1. අස්වනු නෙළීමේදී 2. අස්වනු පිරිසිදු කිරීමේදී


3. අස්වනු ගබඩා කිරීමේ දී (ලකුණු 3×3 = 9)

D. කලලයේ ක්‍රියාශීලී වර්ධනය හේතු කොට ගෙන බීජාවරණය පලාගෙන බීජ පැළය මතුවීම බීජ ප්‍රරෝහණය වේ.

I. බීජ ප්‍රරෝහණ ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් සඳහන් කරන්න.

1. බීජයට නිපානය මගින් ජලය ඇතුළු වීම.
2. එන්සයිම ක්‍රියාත්මක වීම.
3. වර්ධනය ආරම්භ වීම.
4. බීජාවරණය පිපිරීම.
5. බීජ පැළය මතු වීම. (ලකුණු 3×5 = 15)

E. පහත දැක්වෙන්නේ පලිබෝධ නාශක යෙදීමේ දී වැදගත් වන උපකරණයකි.



I. මෙම උපකරණය නම් කරන්න.

බලවේග දියර ඉසින යන්ත්‍රය (ලකුණු 3×1 = 03)

II. ඉහත උපකරණයේ පහත කොටස් නම් කරන්න.

A - සොඩ නලය B - ට්‍රිගර් කපාටය

C - පංකා තැටිය D - දියර ටැංකිය (ලකුණු 2×4 = 08)

III. විසර්ජන හා ඉසීමේ ක්‍රම වලට අමතරව පළිබෝධ නාශක යෙදීමේ වෙනත් ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 1×2 = 02)

1. පස සමග මිශ්‍ර කිරීම 2. ඇමක් ලෙස *. ගිල්වීමක් ලෙස *. ආලේපනයක් ලෙස

IV. පළිබෝධ නාශක භාවිතයේ දී හා යෙදීමේ දී පිළිපැදිය යුතු ආරක්ෂණ පිළිවෙත් එකක් ලියන්න.

සුළං හමන දිශාවට ලම්භකව යෙදීම(ආහාර පාන, බුලත් විට කෑම, දුම්බීම සිදු නොකිරීම,යෙදෙන අතරතුර දහඩිය පිස දැමීමෙන් වැළකීම, නොසලය අවහිරවීමකදී කට තබා පිඹීමෙන් වැළකීම, පැහැදිලි අහසක් ඇති විට උදය සවස පළිබෝධනාශක යේදීම, තද සුළං, සැඩ හිරු රැස් ඇති විට පරිභෝධ නාශක නොයෙදීම) (ලකුණු 3×1 = 03)

F. I. පාංශු ප්‍රතික්‍රියාව යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

පසෙහි ආම්ලික හෝ භාෂ්මික බව. (ලකුණු 4×1 = 04)

II. පාංශු ප්‍රතික්‍රියාව නිර්ණය කරනුයේ කෙසේද?

පාංශු pH අගය මගින් (ලකුණු 2×1 = 02)

III. පාංශු ප්‍රතික්‍රියාව නිර්ණය කිරීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1. පසේ ආම්ලිකතාව, ක්ෂාරීයතාව පිළිබඳ දැනගැනීමට.
2. පසේ ඇති ඛනිජ ශාකවලට ලබාගත හැකි තත්ත්වයේ පවතී දැයි ගැනීමට. (ලකුණු 4×2 = 08)


IV. පාංශු ලවණතාව හා ක්ෂාරීයතාවයට බලපාන ප්‍රධාන අයනය සඳහන් කරන්න.

Na^+ (ලකුණු 2×1 = 02)

V. ක්ෂාරීය පසක් යථා තත්ත්වයට පත් කළ හැකි ආකාරය සඳහන් කරන්න. (ලකුණු 3×1 = 03)

පසට ජිප්සම් යෙදීම මුළු ලකුණු 100

03. A. බෝග වගාවේ දී පළිබෝධ කළමනාකරණය ඉතා වැදගත් වේ. ඒ සඳහා වැදගත් වන ගහන ඝනත්වය අනුව පළිබෝධ හානියේ මට්ටම් හඳුනා ගැනීමේ දී සීමාව ලෙස යොදා ගන්නා කල්පිත ගහන මට්ටම් පෙන්වන ප්‍රස්ථාරයක් පහත දැක්වේ.



I. ඉහත ප්‍රස්ථාරයේ ආර්ථික දේහලීය මට්ටම සහ වඝංගත තත්ත්වය හඳුනාගන්න.

1. ආර්ථික දේහලීය මට්ටම - C 2. වඝංගත තත්ත්වය - A (ලකුණු 2×2 = 04)

II. ක්ෂේත්‍රයේ දී පළිබෝධ ගහන ඝනත්වය තීරණය කිරීමට භාවිත කරන උපකරණය කුමක්ද?

සිව්රැස (ලකුණු 2×1 = 02)

III. ඉහත X තත්ත්වය ඇතිවීමට හේතු දෙකක් සඳහන් කරන්න.

වෙනත් පරිසරයකින් අලුත් කෘමි විශේෂයක් නව පරිසරයට ඇතුළු වීම/ විකෘති මගින් පළිබෝධ ප්‍රචණ්ඩ මාදිලි ඇති වීම/ අධික පොහොර භාවිතය නිසා ශාක කොටස් මෘදු හා මාංසල තත්වයට පත් වීම හේතුවෙන් ඒ මත යැපෙන ජීවීන්ගේ ගහනය වැඩි වීම/ වැඩි අස්වනු ලබා දෙන ඇතැම් ප්‍රභේද පළිබෝධ වලට අඩු ප්‍රතිරෝධිතාවන් දැක්වීම. (ලකුණු 2×2 = 04)

B. තරගකාරී වෙළඳපළක එක්තරා භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

Qd = 50 - 2p Qd = ඉල්ලුම් ප්‍රමාණය Qs = සැපයුම් ප්‍රමාණය

Qs = 20 + 4p P = මිල (රු)

I. වෙළඳපළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය සොයන්න.

Qd = Qs

50-2P = 20 + 4P

30 = 6 p

P = රු.5.00 (ලකුණු 3×1 = 03)

Qd = 50 – 2P

= 50-10

= 40 (ලකුණු 3×1 = 03)

II. මෙම භාණ්ඩය සඳහා රජය විසින් රු.10.00 අවම මිලක් නියම කළ විට ඇතිවන අධි සැපයුම ගණනය කරන්න.

Qs = 20+ 4P

= 20 + 40 =60

අධි සැපයුම = 60 -40 =20 (ලකුණු 3×1 = 03)

C. සත්ත්ව පාලන ගොවිපළක දක්නට ලැබුණු උපකරණයක් පහත රූපයේ දැක්වේ.



I. එම උපකරණය හඳුනා ගන්න. කෘත්‍රිම යෝනිය (ලකුණු 3×1 = 03)

II. එහි භාවිතය සඳහන් කරන්න.

කෘත්‍රිම සිංචනය සඳහා ශුක්‍රාණු එකතු කිරීමට. (ලකුණු 3×1 = 03)

III. හිස්තැන් පුරවන්න.


එළකිරිවල සංයුතිය සැලකීමේදී, එහි අඩංගු ප්‍රධානම සංඝටකය වන්නේ ජලය වේ.
කිරිවල අඩංගු ප්‍රධාන කාබෝහයිඩ්‍රේටය ලැක්ටෝස් වන අතර එය කිරි සීනි ලෙස හඳුන්වයි.
කිරි වල මේද ප්‍රතිශතය සෙවීම සඳහා බහුලව භාවිතවන ක්‍රමය ගර්බර් ක්‍රමය නම් වේ.
කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වලදී කිරිවල විශිෂ්ට ගුරුත්වය මැනීම සඳහා ලැක්ටො මීටරය භාවිතාවේ.

(ලකුණු 3×5 = 15)

D. I. ගොවිපළ සතුන් තුළ දැකිය හැකි ආහාර ජීර්ණ පද්ධති ආකාර දෙකක් නම්කරන්න .

1. රෝමාන්තික ආහාර ජීර්ණ පද්ධතිය.
2. සරල ආමාංශයික ආහාර ජීර්ණ පද්ධතිග (ලකුණු 3×2 = 06)

II. කුකුළාගේ ආහාර මාර්ග පද්ධතියේ රූප සටහනක් පහත දැක්වේ.එහි A, B, C කොටස් නම් කරන්න.



A - ගොයුර
B - පූර්වාමාශය
C - වටනය

(ලකුණු 3×3 = 09)

III. ඉහත කොටස් අතරින් ගවයාගේ යාන්ත්‍රික ජීරණය සිදුවන කොටසට කෘත්‍යයෙන් සමාන වන්නේ කුමන කොටසද? වටනය/වාරවකය (ලකුණු 3×1 = 03)

IV. රක්කවීමට සුදුසු බිත්තරයක තිබිය යුතු බාහිර ලක්ෂණ දෙකක් නම් කරන්න.
1.බිත්තර කටුවේ පිරිසිදු බව 2. 54 -58g බරකින් යුක්ත වීම. 3.හැඩ දර්ශකය 74%ක් වීම.
(ලකුණු 3×2 = 06)

E. බෝග වගාවන් සඳහා වර්ෂාවෙන් ලැබෙන ජලය ප්‍රමාණවත් නොවන විටදී කෘතිමව වගා බිම් සඳහා ජලය සැපයිය යුතුය.

I. ජල සම්පාදන ක්‍රමයක් තෝරාගැනීමේ දී සලකා බලන ප්‍රධාන සාධක තුනක් සඳහන් කරන්න.

1.පාංශු සාධක. 2.දේශගුණික සාධක 3.බෝග සාධක (ලකුණු 3×3 = 09)

II. ශ්‍රී ලංකාවේ බහුලව භාවිත වන ජල හානිය අවම වන ජල සම්පාදන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1. බිංදු, විසිරි ජල සම්පාදනය 2. උපපෘෂ්ඨීය ජල සම්පාදනය (ලකුණු 4×2 = 08)

III. ජල සම්පාදන ක්‍රම අතරින් පොහොර යෙදීම(Fertigation) සඳහා වඩාත් උචිත වන ජල සම්පාදන ක්‍රමය සඳහන් කරන්න. බිංදු ජල සම්පාදනය (ලකුණු 3×1 = 03)

IV. ඉහත (III)හි සඳහන් කරන ලද ජල සම්පාදන ක්‍රමය වඩාත් උචිත යැයි යෝජනා කිරීමට හේතුව සඳහන් කරන්න . බිංදු ජල සම්පාදනයේ දී ශාක පත්‍රමතට පොහොර (ලවණ) වැටීමෙන් පත්‍ර පිළිස්සීයාම සිදු නොවන නිසා. (ලකුණු 4×1 = 04)

F. කෘෂි අංශයේ විවිධ අවස්ථාවලදී පුද්ගලයින්ට විවිධ ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ.

I. කෘෂිකර්මාන්තයේ දී ආපදා සිදුවිය හැකි අවස්ථා තුනක් සඳහන් කරන්න.
1.කෘෂි උපකරණ භාවිතයේ දී. 2. සර්ප දෂ්ටන 3. කෘමි දෂ්ටන (ලකුණු 2×3 = 06)

II. කෘෂිකර්මාන්තය ආශ්‍රිත බහුල සංක්‍රමණික රෝග දෙකක් සඳහන් කරන්න.
1.බෘසෙල්ලෝසිස්, ක්ෂය රෝගය 2. මී උණ (ලකුණු 3×2 = 06)

මුළු ලකුණු 100

04. A. බෝග සංස්ථාපනයේදී රෝපණ ද්‍රව්‍ය නිපදවා ගැනීමට බොහෝ අවස්ථාවල තවාන් භාවිතා වේ.

I. පහත තවාන් සඳහා උචිත වන බෝගය බැගින් සඳහන් කරන්න.
1. නොරිඩෝකෝ තවාන - වැටකොළු,පතෝල,වට්ටක්කා.(කුකර්බිටේසියේ කුලයේ ශාක)
2. වැලි තවාන - අඹ, අලිපේර, රාඛු, කෝපි,රබර්
3. ඩැපොග් තවාන - වී, තෘණ
4. මඩ තවාන - වී (ලකුණු 3×4 = 12)

II. තවාන් දැමීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.
සිටුවීමට නිරෝගි දිරිමත් පැල ලබා ගැනීමට, ඒකාකාරී පැළ ගහනයක් පවත්වා ගැනීමට, අඩු ඉඩකින් වැඩි පැළ සංඛ්‍යාවක් ලබා ගැනීමට, කන්න අතර පරතරය අඩුකිරීමට,වගා පාළුව අවම කිරීමට (ලකුණු 3×2 = 06)


III. තවාන් ජීවානුහරණයේ මූලික අරමුණ සඳහන් කරන්න.
පසේ සිටින රෝග කාරකයින් හා පළිබෝධ ජීවන චක්‍රයේ විවිධ වර්ධක අවධි විනාශ කිරීම.

(ලකුණු 3×1 = 03)

V. තවාන් ජීවානුහරණය සඳහා භාවිත කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.
පිළිස්සීම, තවානට දිලීර නාශක යෙදීම

අධික සූර්යතාපයට භාජනය, ධූමාකරණය, නටන ජලය යෙදීම. (ලකුණු 3×2 = 06)

B.I කිසියම් භාණ්ඩයක නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ මුළු පිරිවැය (TC), මුළු විචල්‍ය පිරිවැය (TVC) සහ මුළු ස්ථාවර පිරිවැය(TFC) වක්‍රවල හැඩයන් පහත ප්‍රස්ථාරයේ ඇඳ දක්වන්න.



(ලකුණු 3×3 = 9)

II. කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ ප්‍රධාන පියවර හතර සඳහන් කරන්න.
1.සැලසුම් කිරීම. 2.සංවිධානය කිරීම.
3.මෙහෙය වීම. 4.පාලනය කිරීම. (ලකුණු 3×4 = 12)

C. වර්තමානයේදී කෘෂි ක්ෂේත්‍රය විවිධ අභියෝගවලට මුහුණ දී ඇත.

I. වර්තමානයේදී කෘෂි කර්මාන්තය මුහුණපා ඇති ප්‍රධාන අභියෝග දෙකක් සඳහන් කරන්න.

1.බීජ ඒකාධිකාරිය, ජාන විකරණයකල අහාර

2. සම්පත් හිඟවීම, දේශීය බෝග ආරක්ෂා නොවීම (ලකුණු 3×2 = 06)

II. ඉහත ඔබ සඳහන් කළ අභියෝග ජයගැනීම සඳහා උචිත උපායමාර්ග දෙකක් යෝජනා කරන්න.
1.ස්වයං බීජ නිෂ්පාදනය, කෘෂි සම්පත් කාර්යක්ෂමතාව භාවිතා කිරීම.
2.ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, ප්‍රශස්ත පාරිසරික තත්ත්ව ලබා දී, ප්‍රශස්ත නිෂ්පාදන ලබා ගැනීම, ජාන විකරණය කරන ලද අහාර නිෂ්පාදනයේ දී හානිකර නොවන රසායන ද්‍රව්‍ය යොදා ගැනීම, යථාතත්‍ය කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය. (ලකුණු 3×2 = 06)

D. ආහාර නරක් වීමට බලපාන සාධක කෘතිමව පාලනය කරමින් ආහාර පරිරක්ෂණය කරනු ලැබේ.
I. ආහාර පරිරක්ෂණ මූලධර්ම දෙකක් සඳහන් කර ඒ සඳහා උදාහරණය බැගින් දෙන්න.
මූලධර්මය උදාහරණ (ලකුණු 2×4 = 08)
1.නිෂේධන කිරීම වියළීම, ලුණු දැමීම, සාන්ද්‍රිකරණය,ශීතනය හා අධිශීතනය,පැසවීම
2. අක්‍රීය/ විනාශ කිරීම පැස්චරීකරණය,ජීවාණුහරණය

II. ආහාර පරිරක්ෂණය කිරීමට පෙර සිදුකරන පූර්ව ප්‍රතිකාර ක්‍රමය සඳහන් කරන්න.
බ්ලාන්චීකරණය/ සුබ්‍රීකරණය (ලකුණු 3×1 = 03)

III. ඉහත(II) හි සඳහන් පූර්ව ප්‍රතිකාරය භාවිතා කරමින් ආහාර පරිරක්ෂණය සිදුකරන අවස්ථා සඳහා උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න.
1.එළවළු හා පළතුරු වියලීම,ටින් කිරීම 2.අධිශීත කිරීම (ලකුණු 3×2 = 06)

IV. ආහාර සැකසීමේ නව ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න.
1.අවම සැකසීම 2. සරු කිරීම, ප්‍රබල කිරීම (ලකුණු 2×2 = 04)

E. I. කිසියම් ශාකයක බීජ සිටුවා ඉන් ලැබෙන පැළ පරම්පරා කිහිපයක් තිස්සේ නිරීක්ෂණය කළ විට බොහොමයක්ම මවුපිය පරම්පරා වල ලක්ෂණ පෙන්නුම් කිරීමක් දක්නට ලැබිණි. එසේ වීමට හේතු විය හැකි තත්ත්වය කුමක්ද? ස්ව පරාගනයට ලක් වීම. (ලකුණු 3×1 = 03)

II. ඉහත පිළිතුරට හේතුවන තත්ත්වය පවත්වා ගැනීමට ශාකවල ස්වභාවික ඇති ව්‍යුහාත්මක වෙනස්කමක් දක්වන්න.
ද්වි ලිංගික පුෂ්ප දැරීම.(පුෂ්ප විවෘත වීමට ප්‍රථම එම පුෂ්පයේ පරාග කණිකා එම පුෂ්පයේ ම කලංකය මත වැටී පරාගනය වීම, විවෘත පුෂ්පවල රෙණු, කලංකයේ අනෙක් පුෂ්ප කොටස් වල සැගව තිබීම/පරාගධානී විවෘත වීම හා සමගාමීව කලංකය පරාගධානිවල වැදෙන ලෙස දිගුවීම.)
(ලකුණු 3×1 = 03)

III. සිටුවීම සඳහා යොදාගත් ජීව්‍යතාවයෙන් යුත් ගස්ලබු බීජ බොහෝමයක් ප්‍රරෝහණය නොවූ බව ශිෂ්‍යයෙකු පවසන ලදී එසේ වීමට හේතු සඳහන්කරන්න.
සුප්තතාවය (ලකුණු 3×1 = 03)

IV. එම ප්‍රරෝහණය කරවීම සඳහා කළ යුතු ප්‍රතිකර්මයක් සඳහන් කරන්න.
අළු/වැලි සමග මිශ්‍ර කර පොඩි කර ජලයෙන් සෝදා හැර සිටුවීම. (ලකුණු 3×1 = 03)

V. බීජ හැර ශාක ප්‍රචාරණය කිරීමට භාවිත කරන කෘත්‍රිම වර්ධක ප්‍රචාරණ ක්‍රම දෙකක් නම් කරන්න.
1.බද්ධ කිරීම, ලේයර් කිරීම.
2.අතු, පතු කොටස්, පටක රෝපණ ආදි. (ලකුණු 2×2 = 04)

VI. අලිංගික ශාක ප්‍රචාරණයෙන් ලැබෙන ප්‍රධාන වාසියක් සඳහන් සඳහන් කරන්න.
මව් ශාකයට සමාන ද්‍රහිතෘ ශාක ලබා ගැනීම. (ලකුණු 3×1 = 03)


මුළු ලකුණු 100

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK